# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/21 - 2017 ජූනි මස 27 වැනි අඟහරුවාදා - 2017.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරතුමන් විසින් කරන ලද පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ඌව පළාත් ප්‍රධාන ලේකම් ගාමිණි රාජකරුණා මහතා, 2017.01.21 දින සිට 2017.02.01 දින දක්වා විදේශ ගත වන බැවින්, 2017.01.21 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරී ජී. කේ. එස්. එල්. රාජදාස මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් ප්‍රධාන ලේකම් තනතුරේ වැඩ බැලීමට,

02. ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික හා පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, 2017.01.14 වන දින සිට 2017.02.13 වන දින දක්වා විදේශ ගත වන බැවින්, 2017.01.14 වන දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරී, ජී. කේ. එස්. එල්. රාජදාස මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික හා පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

03. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරිණී වෛද්‍ය එම්. කේ. ඩී. සේනානායක මහත්මිය 2017.01.10 වන දින සිට ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2017.06.30 වන දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට.

04. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I පන්තියේ නිලධාරී එස්. කේ. වීරසුන්දර මහතා 2017.02.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

1A - PG 3584 — 57 (2017/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. ඌව පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය 2017.02.27 වන දින සිට 2017.03.11 වන දින දක්වා විදේශ ගත වන බැවින්, 2017.02.27 වන දින සිට ඒ මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරිණී, ඩී. එම්. විනිතා දිසානායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

06. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ආර්. එම්. පී. රත්නායක මහතා 2017.02.27 වන දින සිට 2017.03.12 වන දින දක්වා විදේශ ගත වන බැවින්, 2017.02.27 වන දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ඩී. එම්. රත්නායක මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි එස්. බී. උඩෝවිට මහතා 2017.04.07 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බදුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වශයෙන්,

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරි ඩබ්ලිව්. රන්දෙණිය මහතා 2017.04.07 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීමට,

09. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ගුණදාස සමරසිංහ මහතා 2016.07.01 දින සිට බල පැවැත්වෙන පරිදි ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ලේකම් වශයෙන්,

ඇම්. පී. ජයසිංහ,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2017 ජුනි මස 20 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07 - 339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.